කොත්මලේ ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 28 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 නොසැසඳූ පාලන ගිණුම්.

---------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව කර්මාන්ත ණයහිමි වටිනාකම රු.28,829,163ක් වූ අතර උපලේඛනය අනුව එය රු.30,916,280ක් වූයෙන් රු.2,087,117ක නොසැසඳීමක් විය.

1.3.2 ලැබිය යුතු ගිණුම්

--------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.28,829,163ක කර්මාන්ත ණයගැති ශේෂයෙන් 2011 වර්ෂයේ සිට මධ්‍යම රජයෙන් ලැබිය යුතු මුදල රු.1,073,816ක් විය. මුදල් සභාවට ලැබෙන බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

---------------------

2014 දෙසැම්බර් 31 දිනට අවු:01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,047,939ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,182,728ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,212,681ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ රු.2,029,953කින් ආදායමේ පිරිහීමක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2014.01.01 දිනට හිඟ ආදායම | 2014 වර්ෂයේ බිල්කළ ආදායම | 2014 වර්ෂය තුළ එකතු කළ යුතු මුළු ආදායම | ආදායම් එකතු කිරීම 2014.01.01 දිනට හිඟ ආදායමෙන් | 2014 බිල්කළ ආදායමෙන් | එකතු කළ මුළු ආදායම | හිඟ ආදායම 2014.01.01 දිනට හිඟ ආදායමෙන් | 2014 බිල්කළ ආදායමෙන් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,490,555 | 3,130,811 | 4,621,366 | 1,217,155 | 2,509,258 | 3,726,413 | 273,399 | 621,553 | 894,952 |
| අක්කර බදු | 108,570 | 64,841 | 173,411 | 35,018 | 53,001 | 88,019 | 73,552 | 11,840 | 85,392 |
| වෙළඳ බලපත්‍ර | - | 2,643,882 | 2,643,882 | - | 2,643,882 | 2,643,882 | - | - | - |
| ගෙවල් කුලී | 7,942 | 48,535 | 56,470 | 192 | 48,451 | 84,643 | 7,750 | 84 | 7,834 |
| ජල බදු | 895,813 | 833,670 | 1,629,843 | 203,830 | 474,470 | 678,300 | 691,983 | 259,200 | 951,183 |
| කඩ කුලී | 78,834 | 1,188,000 | 1,266,834 | 1,000 | 1,188,000 | 1,189,000 | 77,834 | - | 77,834 |
| ව්‍යාපාර බදු | - | 351,550 | 351,550 | - | 351,550 | 351,550 | - | - | - |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා මූල්‍ය පරිපාලන) රීති 07 ප්‍රකාරව සෑම වර්ෂයක්ම ආරම්භයේදී විධිමත් සමීක්ෂණයක් මගින් සභාව ව්‍යාපාරිකයන්ගේ නම් බලපත්‍ර ලේඛණයට ඇතුළත් කර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). 2014 සැප්තැම්බර් 30 දිනට රු.892,601ක අයවිය යුතු වරිපනම් බදු මුදලක් පැවතියද, ඒ සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති මාලාවේ 33වෙනි රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ). වාර්ෂික පරිසර බලපත්‍ර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, නිකුත් කර තිබුණු පරිසර බලපත්‍ර 26ක් යාවත්කාලීන නොකිරීම හේතුවෙන් සභාවට රු.96,800ක ආදායමක් අහිමිවී තිබුණි.

(ඈ). 1986 වර්ෂයේ සිට හිඟ මස්කඩ කුලී වශයෙන් බදුකරුවන්ගෙන් ලැබිය යුතු රු.78,500ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ පනවන ලද අධිභාර අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු.77,490ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය ඇගයීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අරමුණු සාක්ශාත් කරගැනීම, තහවුරු කරගැනීම සඳහා පිළියෙල කර තිබූ පාලන වාර්තා මගින් භෞතික හා මූල්‍ය කාර්යය සාධනය සංසන්දනය කිරීමට නොහැකි විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 218 විධිවිධාන පරිදි සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික පරික්ෂණයක් කර නොතිබුණි.

(ආ). හිමිකම් ඔප්පු හා පිඹුරුපත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වටිනාකම රු.50,957,068ක් වන ඉඩම් හා ගොඩනැගිලිවල නීත්‍යානුකූල හිමිකාරත්වය හා නිවැරදි වපසරිය තහවුරු කරගැනීමට නොහැකි විය.

(ඇ). සභා බලප්‍රදේශය තුළ 2014 වර්ෂය තුළදී අනවසර ඉදිකිරීම් 138ක් සිදුකර තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි

3.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්
-----------------------------------------

(අ). කොත්මලේ නව නගරයේ ඇති සතිපොළ ගොඩනැගිල්ල වසර 06ක් භාවිතා කිරීමකින් තොරව වල් බිහිවී පවතින නමුත් එය නඩත්තු කිරීමට හෝ අරමුණුගත කාර්යයන්හි යෙදවීමට සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ). අංක J.D 4866 දරන නිසාන් කැරවන් වර්ගයේ ගිලන් රථය 2010 වර්ෂයේ සිට වසර 05කට අධික කාලයක් ධාවනයෙන් ඉවත්කර කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

ප්‍රාදේශීය සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිකර පරිදි කසළ බැහැර කරමින් පැවතුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
------------------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 උප පරිච්ඡේද ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් භාවිත කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය
-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඡ්/2009/01 දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 අයවැය පාලනය.

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 06ක 16% සිට 72% දක්වාද වියදම් විෂයයන් 06 ක 05% සිට 748% දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). අභ්‍යන්තර පාලනය.

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). ණයගැති ණයහිමි පාලනය.

(ඉ). වත්කම් කළමනාකරණය.